# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2456/79 – 2025 ඔක්තෝබර් මස 04 වැනි සෙනසුරාදා – 2025.10.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත

**27(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය**

1975 අංක 39, 1981 අංක 14, 1981 අංක 39, 1986 අංක 18 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම, ඉහත කී පනතේ විධිවිධාන යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් කෘෂිකාර්මික ඉඩම් කොටස් එකී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)ආආ වගන්තිය ප්‍රකාරව 1981 අංක 73 දරන පනත මඟින් පිහිටුවා ඇති මාර්ග සංවර්ධන අධිකාරිය වෙත විකිණීමෙන් පවරා දෙනු ලැබේ.

(1) ඉහත කී විකිණීම සඳහා මුදල් ප්‍රතිෂ්ඨාව වශයෙන් රු. 2,454,000/- ක (විසිහතර ලක්ෂ පනස් හතර දහසක) මුදලකට එකී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පහත උපලේඛන ගත ඉඩම මෙම නියමය මඟින් සතු කර පවරා දෙමි.

| උපලේඛන | ඉඩමේ නම | පිඹුරු අංකය | කැබලි අංකය | ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | අක්. | රූඩ් | පර්. |
| 01. | ඇතුන්ගහතැන්න වත්ත හෙවත් මාකස් වත්ත | 10460 | 01 | 1 | 2 | 24.95 |
| | ඇතුන්ගහතැන්න වත්ත හෙවත් මාකස් වත්ත | 10460 | 07 | 0 | 1 | 1.74 |

**කුරගමගේ දොන් ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 අගෝස්තු මස 26 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A – G 044511 – 06 (2025/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය **: ඇතුන්ගහතැන්න හෙවත් මාකස් වත්ත**

ඉඩමේ විස්තරය **:** බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටියන ගමෙහි පිහිටි ඇතුන්ගහතැන්න වත්ත *හෙවත්* මාකස් වත්ත නමැති ඉඩම විශේෂ අංක පු/41 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. මෙම ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් මහතා විසින් 2019.12.15 දිනැතිව පිළියෙල කරන ලද අංක 10460 දරන පිඹුරෙහි පහත සඳහන් කැබලිවලට හා ප්‍රමාණයන්ට මායිම්ව,

**කැබලි අංක 01 – ප්‍රමාණය: අක්කර 01, රූඩ් 2, පර්. 24.95 (හෙක්. 0.6701)**

*උතුරට* : ඒ. ඒ. දන්දෙණිය සහ තවත් අය හිමිකම් කියන ඇතුන්ගහතැන්න වත්ත;
*නැගෙනහිරට* : කැබලි අංක 5 සහ 3;
*දකුණට සහ බටහිරට* : පාර (ප්‍රාදේශීය සභා), කැබලි අංක 2 සහ පාර (ප්‍රාදේශීය සභා).

**කැබලි අංක 07 – ප්‍රමාණය: අක්කර 00, රූඩ් 1, පර්. 1.74 (හෙක්. 0.1056)**

*උතුරට* : කැබලි අංක 06, 05 සහ 08;
*නැගෙනහිරට සහ දකුණට* : කැබලි අංක 08;
*බටහිරට* : කැබලි අංක 08 සහ පාර (ප්‍රාදේශීය සභා).

EOG 10 – 0055